# සිංහල භාෂාවේ අක්ෂර වින්‍යාසය

කිසියම් භාෂාවක එම භාෂාවේ රීතීන්ට අනුව නිවැරදි ව අක්ෂර ලිවිය යුතු පිළිවෙළ (හෙවත් සම්මත ආකාරය) බෙදා දැක්වීම අක්ෂර වින්‍යාසය නමින් හැඳින්වේ. අක්ෂර වින්‍යාසය වඩාත් බලපාන්නේ ලේඛනයෙහි දී ය. වැරදි ලෙස අක්ෂර භාවිත කිරීමෙන් අර්ථාවබෝධයට බාධා ඇති විය හැකි ය. සිංහල හෝඩියේ 'ණ, න' අකුරු දෙක ද 'ල, ළ' යන අකුරු දෙක ද 'ඛ, ඝ, ඡ, ඣ, ඨ, ඪ, ථ, ධ, ඵ, භ' යන මහාප්‍රාණ අකුරු ද 'ශ, ෂ, ස' යන උෂ්මන් අකුරු ද අක්ෂර වින්‍යාසයේ දී බෙහෙවින් අදාළ වන අකුරුයි. ඒ අතර ද 'න, ණ, ල, ළ' අකුරු වඩාත් වැදගත් වේ. ඇතැම් විට කලින් කලට මෙන් ම විවිධ ප්‍රදේශවල ව්‍යවහාරය අනුව අක්ෂර වින්‍යාසයේ සම්මතයන්හි වෙනස්කම් දැකිය හැකි ය. එබැවින් වඩාත් වැදගත් වන්නේ වර්තමානයේ කිසියම් නිශ්චිත භූමියක පවත්නා සම්මත ව්‍යවහාරය හඳුනා ගැනීමයි.

ඉහත සඳහන් අක්ෂරයන්ට අදාළ සිංහල භාෂාවේ අක්ෂර වින්‍යාසය කෙරෙහි බලපාන රීති සමූහයක් අපට හඳුනා ගත හැකි ය. ඒවා මෙසේ සංග්‍රහ කොට දැක්විය හැකි ය.

මාතෘ භාෂාගත (සංස්කෘත, පාලි) වචනවල 'ර' කාරයට පසුව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

උදා :- සරණ, ධාරණ, කාරණ, විවරණ, මරණ, රණ, වාරණ,

'ර්' කාරය වෙනුවට යෙදෙන 'ර කාරාංශය', 'රේඵය' යන දෙකට පසුව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

උදා :- මන්ත්‍රණ, අප්‍රාණික, වර්ණ, සම්පූර්ණ, ස්වර්ණ, මිශ්‍රණය, කර්ණ, නිර්ණය

මූර්ධජ 'ෂ' හා 'ඍ' යන අකුරුවලට පසුව යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

උදා :- දූෂණය, රක්ෂණය, නිරීක්ෂණ, ඍණ, ඍණීකෘත, තෘණ

මුලට 'ණ' කාරය යෙදුණු පද සිංහලයේ ඇත්තේ සීමිත සංඛ්‍යාවකි.

උදා :- ණය, ණිහ (බල්ලා), ණිහිය (ලේලිය)

ප්‍රකෘතියෙක අවසානයේ යෙදෙන 'ණ', 'ළ' යන අකුරු හල් නොවේ.

උදා :- තොරණ, සෙවණ, දළ, නළ (වායුව), බළ, බණ, පහණ

මාතෘභාෂාගත වචනවල මූර්ධජ අකුරකට පූර්වයෙන් යෙදෙන්නේ මූර්ධජ හල් 'ණ්' කාරයයි.

උදා :- කණ්ටක, මණ්ඩලය, කණ්ඨජ, සණ්ඨාව, කාණ්ඩය, භාණ්ඩ, පණ්ඩිත

කර්මකාරක ආඛ්‍යාත ප්‍රත්‍යවල හා කර්මකාරක අතීත කෘදන්ත පද සමඟ යෙදෙන්නේ මූර්ධජ 'ණ' කාරයයි.

උදා :- බැලිණි, හෙළිණි, දනුණි, බැලුණු, විසිරුණු, බැබළුණු

ධාතුවක් හා බැඳෙන නාම පදයෙහි අන්ත්‍ය අක්ෂරය 'ණ' හෝ 'ළ' වෙයි.

උදා :- දණ, බණ, පණ, අණ, වළ, බළ

වර්තමාන කෘදන්ත පද සමඟ යෙදෙන්නේ දන්තජ 'න' කාරයයි.

උදා :- කරන, හදරන, බලන, කරනු, හදරනු, බලනු

ණ, න යෙදීම අනුව පදයක අර්ථය වෙනස් වේ.

| | | |
|---|---|---|
| උදා :- | දන (ජනයා) | දණ (දණ හිස) |
| | වන (වනාන්තරය) | වණ (තුවාලය) |
| | කන (ශ්‍රවණේන්ද්‍රිය) | කණ (ඇසක් නොපෙනෙන) |

ළපටි, කුඩා, සමීප හෝ යොවුන් යන අර්ථයේ යෙදෙනුයේ මූර්ධජ 'ළ' කාරයයි.

උදා :- ළපටි, ළමැද, ළය, ළමා, ළසඳ, ළහිරු, ළදරු, ළමයා

ගෞරවාර්ථයෙහි යෙදෙන නාම පදයට එක්වන 'ආණ, අණි, අණු' යන ප්‍රත්‍යවල ඇත්තේ මූර්ධජ 'ණ' කාරයයි.

උදා :- පියාණ, දියණි, පුතණු, මෑණි

රකාරාන්ත ධාතුවකින් තැනෙන අතීත ක්‍රියා රූපවල 'ර' කාරය වෙනුවට මූර්ධජ 'ළ' කාරය යෙදේ.

| | | | |
|---|---|---|---|
| උදා :- | කර - කළ | මර - මළ | හදර - හදළ |
| | වදර - වදළ | ගුගුර - ගුගුළ | වගුර - වගුළ |
| | වපුර - වපුළ | පතුර - පතළ | කොඳුර - කොඳුළ |
| | මතුර - මතුළ | හර - හළ | විසුර - විසුළ |

ට, ඨ, ඩ, ඪ, ණ යන මූර්ධජ අක්ෂර සහිත මාතෘභාෂාගත පදයක් සිංහලට බිඳෙන විට ඒ අක්ෂර වෙනුවට යෙදෙන්නේ 'ළ' අක්ෂරයයි.

| | | | |
|---|---|---|---|
| උදා :- | දඨා - දළ | පඨවි - පොළොව | පටිපාටි - පිළිවෙළ |
| | සාටක - සළු | බිඩාල - බළලා | වාණිජ - වෙළෙඳ |
| | දෘඪ - දළ | | |

දන්තජාක්ෂර (තවර්ග අකුරු, ස ආදිය) සමඟ සංයෝග ව බොහෝ විට යෙදෙන්නේ දන්තජ 'ස' යන්නයි.

උදා :- විස්තර, ස්තන, ප්‍රස්තාර, ස්තූප, ශාස්ත්‍රය, ප්‍රස්තාවනා, ලස්සන, ස්තර,

එලෙස නොයෙදෙන තැන් :- ස්ථාවර, ස්ථවිර, ස්ථිර, ස්ථානය, ස්ථූල, ස්ථාන

'ඓ' කාරයෙන් කිසියම් පදයක් ආරම්භ වීමේ දී එම පද ලිවිය යුතු පිළිවෙළ.

උදා :- ඓතිහාසික, ඓශ්වර්ය, ඓරාවණ

ඓක්‍ය, ඓහලෞකික, ඓන්ද්‍රජාලික

කිසියම් පදයක් ආරම්භ වන්නේ ව්‍යඤ්ජනයක් සහිත 'ඓ' කාරයකින් නම් එවැනි පද ලිවිය යුතු පිළිවෙළ.

උදා:- කෛලාස, දෛනික, නෛතික, දෛවය,

ධෛර්යය, නෛපුණ්‍ය, නෛසර්ගික, නෛර්යාණික

කිසියම් පදයක් ආරම්භ වන්නේ ඖ කාරයෙන් නම් එම පදය ලිවිය යුතු ආකාරය.

උදා :- ඖෂධ, ඖදර්ය, ඖදරික,

ඖරස, ඖචිත්‍ය

පදයක් ආරම්භ වන්නේ 'ඖ' කාරයක් සහිත ව්‍යඤ්ජනයකින් නම් එම පදය ලිවිය යුතු ආකාරය.

උදා :- කෞතුක, සෞන්දර්ය, මහෞෂධ, කෞමාර, ගෞරව

පෞරුෂය, ලෞකික, භෞතික, කෞමුදී, මෞර්ය

'ල' කාර දෙකක් එක තැන යෙදෙන නාම පදයක මුල් 'ල' කාරය බෙහෙවින් මූර්ධජ වේ.

උදා :- සළෙල, උළෙල, වළලු

නළල, පළල, අළලනවා

කණ්ඨජ අක්ෂරයක් සමඟ බැඳෙනුයේ දන්තජ 'ස' කාරයයි.

උදා :- නමස්කාරය, මනස්කාන්ත

ඒකවචන නාමපදයක අවසානයේ යෙදෙන 'ල්ල' යන්න බහුවචන වීමේදී දන්තජ 'ලු' වේ.

උදා :- සියල්ල > සියලු බල්ලා > බලු වල්ල > වලු

මල්ල > මලු කොල්ලා > කොලු ගාල්ල > ගාලු

කුරුල්ලා > කුරුලු මහල්ලා > මහලු

ඒකවචන නාමපදයක පද මධ්‍යගත ව 'ළු' ඇති විට එය බහුවචන වීමේදී 'ළු' යෙදේ.

උදා :- සළුව > සළු, සිළුව > සිළු, මළුව > මළු, එළුවා > එළු

සිංහල ලේඛනයේ දී නිතර වරද්දන පද කීපයක් නිවැරදි ව ලිවීම.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| උදා :- | සමස්ත, | ගැටලු, | ධර්මිෂ්ඨ, | ශිෂ්ටාචාරය, | සියලු, | සාර්ථක, |
| | පුස්තකාලය, | වාර්තාව, | දේශනය, | ප්‍රශ්න, | වීරෝදාර, | අබියස, |
| | මර්දනය, | වර්ධනය, | ප්‍රදානය, | ප්‍රධාන අමුත්තා, | ප්‍රදානය (ත්‍යාග) | ප්‍රබෝධවත්, |
| | සජ්ඣායනය, | ප්‍රතිඵල, ප්‍ර | ප්‍රස්තාවනාව, | කල්‍යාණි, | ලේකම්, | ධෛර්යවත්, |
| | ඓශ්චර්යවත්, | ලුණු, | කෲර, | අවශ්‍යතාව, | ආදර්ශවත්, | කැලණි, |
| | ආලෝකවත්, | කනිෂ්ඨ, | භාවිත කරයි, | ස්තූප, | ප්‍රස්තාරය, | සත්ත්වයා, |
| | තත්ත්වය, | දර්ශනය, | කර්තෘ/කතෘ, | ශ්‍රැතිය, | ප්‍රත්‍යවලෝකන, | විස්මිත, |
| | මර්දනය, | ශීඝ්‍රගාමී, | උච්චාරණය, | වාර්තාව, | සම්ප්‍රදාය, | සම්භාෂණය, |
| | ආභාසය, | පරිගණක, | අත්‍යවශ්‍ය, | සත්ත්වයා, | ආශ්චර්ය, | අත්‍යාදර, |
| | ප්‍රත්‍යවේක්ෂණ, | දෘෂ්ටිය, | ක්ලිෂ්ට, | නීත්‍යනුකූල, | ප්‍රතිඵල, | ප්‍රතිකාර, |
| | හස්ත්‍යලංකාර, | අත්‍යලංකාර, | සංවත්සරය, | සාංවත්සරික, | අධ්‍යාත්මය, | ආධ්‍යාත්මික, |
| | අනුමානය, | අණුදක්නය, | රුධිරාණු, | පරමාණු, | ධූපය, | ලූනු (රතු/සුදු) |
| | ළඟ, | අවශ්‍යතාව | කණ්ණාඩිය/ | කන්නාඩිය, | අලුත් (අවුරුද්ද), | සලකනවා |

'අ' 'ආ' හැර වෙනත් ස්වරයකින් පර ව කණ්ඨජ හෝ ඕෂ්ඨජ අක්ෂරයකට පූර්වයෙන් එම කණ්ඨජය හෝ ඕෂ්ඨජය සමග සංයුක්ත ව යෙදෙන්නේ මූර්ධජ 'ෂ' කාරයයි.

උදා :- දූෂණය, දුෂ්කර, නිෂ්පාදනය, අභිනිෂ්ක්‍රමණය, නිෂ්ඵල, දෘෂ්ටි, ද්වේෂ

මූර්ධජාක්ෂරයකට පූර්වයෙන් ඒ හා සංයුක්ත ව යෙදෙනුයේ මූර්ධජ 'ෂ' කාරයයි.

උදා :- ශිෂ්ටාචාරය, අෂ්ටලෝකධර්ම, ක්‍රිෂ්ණ, විෂ්ණු, ධර්මිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ

තාලුජ අක්ෂරයක් සමඟ සංයුක්ත වනුයේ තාලුජ 'ශ' කාරයයි.

උදා :- දුශ්චරිත, දුශ්ශීල, දෘශ්‍යාබාධ

භාවාර්ථ 'ත්ව' ප්‍රත්‍යය සහිත සත්, තත් ආදී ශබ්දවල තත්සම පද භාවිතයේ දී ප්‍රකෘතිගත 'ත්' කාරය හා ප්‍රත්‍යයගත 'ත්' කාරය ලොප් නොවේ.

උදා :- සත්ත්ව - සත්ත්ව = සත්ත්ව සන්තතිය, සත්වෝද්‍යානය

තත්ත්ව - තත්ත්ව = තත්ත්වය, තත්ත්වඥයා

දක්ෂතා, කුශලතා, ප්‍රවීණතා, අවශ්‍යතා ආදී තද්ධිත නාමවලට 'අ, එන්, අට' ආදී විභක්ති ප්‍රත්‍ය එක් වූ විට තැනෙන රූප මෙලෙස ය.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා :- | දක්ෂතා | = | දක්ෂතාව, | දක්ෂතාවෙන්, | දක්ෂතාවට |
| | කුශලතා | = | කුශලතාව, | කුශලතාවෙන්, | කුශලතාවට |
| | ප්‍රවීණතා | = | ප්‍රවීණතාව, | ප්‍රවීණතාවෙන්, | ප්‍රවීණතාවට |
| | අවශ්‍යතා | = | අවශ්‍යතාව, | අවශ්‍යතාවෙන්, | අවශ්‍යතාවට |

අතිශයාර්ථ 'ඉෂ්ඨ' ප්‍රත්‍යයේ ඇති මූර්ධජ 'ෂ' කාරයත් මහාප්‍රාණ 'ඨ' කාරයත් පද සාධනයේ දී නොවෙනස් ව සිටී.

උදා :- පාප + ඉෂ්ඨ = පාපිෂ්ඨ ධර්ම + ඉෂ්ඨ = ධර්මිෂ්ඨ

ජ්‍යා + ඉෂ්ඨ = ජ්‍යෙෂ්ඨ කන් + ඉෂ්ඨ = කනිෂ්ඨ

ශ්‍රා + ඉෂ්ඨ = ශ්‍රේෂ්ඨ

හලන්ත සහ 'අ, ආ, ඇ' කාරාන්ත නාමවලට පරව අස්ත්‍යර්ථ 'වත්' ප්‍රත්‍යයත් 'ඉ' කාරාන්ත, 'උ' කාරාන්ත සෙසු නාමවලට පරව 'මත්' ප්‍රත්‍යයත් එක් වේ.

උදා :- සිල්වත්, ආලෝකවත්, ගුණවත්, ශ්‍රද්ධාවත්, ශෝභාවත්, ප්‍රඥාවත්,

සැදැහැවත්, සිරිමත්, ධිතිමත්, සොඳුරුමත්, ඉසුරුමත්, රූමත්

සන්ධි වීමේ දී පූර්වස්වරය 'ඉ' යන්න වූ විට සහ පරස්වරය 'ඉ, ඊ' හැර අනෙක් ස්වරයක් වූ විට 'ය්' කාරය ආදේශ වේ. එය පරස්වරය සමඟ සන්ධි වන අතර හල් අකුරකින් පරව 'ය' යෙදෙන විට ඒ සඳහා යංශය යෙදේ.

උදා :- අති + අලංකාර = අත්‍යාලංකාර අති + අවශ්‍ය = අත්‍යවශ්‍ය
හස්ති + අලංකාර = හස්ත්‍යාලංකාර අති + අන්ධකාර = අත්‍යන්ධකාර
අති + ආදර = අත්‍යාදර භක්ති + ආදර = භක්ත්‍යාදර
ප්‍රති + උත්තර = ප්‍රත්‍යුත්තර අති + උත්තම = අත්‍යුත්තම
අති + උදර = අත්‍යුදර අති + උත්කෘෂ්ට = අත්‍යුත්කෘෂ්ට

ශ, ෂ, ස යන අකුරකින් පර ව 'ත, ති' යන කෘදන්ත ප්‍රත්‍ය ඇති විට 'ත ස ට' බවටත්, 'ති ස ටි' බවටත් පත් වේ. එහි දී 'ශ, ස' යන අකුරු ද මූර්ධජ 'ෂ' බවට පත් වේ.

උදා :-

නෂ් + ත - නෂ්ට = නෂ්ටාවශේෂ

දෘශ් + ති - දෘෂ්ටි = දෘෂ්ටිය

ශිස් + ත - ශිෂ්ට = ශිෂ්ටාචාරය